／

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2342/19 – 2023 ජූලි මස 25 වැනි අඟහරුවාදා – 2023.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1984 ජුනි මස 08 වැනි දින අංක 300/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 1984 අංක 123 දරන ආඥාවේ කැබලි අංක ඩී32 සිට ඩී64 දක්වා ලෙස සඳහන් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 03J/81/LG/281 IV වෙළුම.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: DSM/DB/LND/4/842-18.

2023 ජුනි මස 21 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, E445, දඹුල්ල නගරය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මිරිස්ගෝනියාව (කොට්ඨාස අංක 06, දඹුල්ල මහ නගර සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූ.පි.මා.842 හා 2022.06.20 දිනැති සංශෝධිත මූලික පිඹුරේ පහත සඳහන් මායිම් තුළ වූ කොටස:

01. **කැබලි අංක 69 – මරදමන්යාය – ප්‍රමාණය: හෙක්. 0.1265**
උතුරට: කැබලි අංක 70; නැගෙනහිරට: කැබලි අංක 70; දකුණට: කැබලි අංක 19; බටහිරට: කැබලි අංක 70.

EOG 07 - 0234